INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA



# ජීවිත රක්ෂණය පිළිබඳ ඔබ දැනුවත්ද?

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

# 1.

# ජීවිත රක්ෂණයක් යනු කුමක්ද?






ජීවිත රක්ෂණය යනු  යම් පුද්ගලයෙකු තම ජීවිතය සම්බන්ධයෙන් සිදුවිය හැකි අනපේක්ෂිත අවදානම් වලට මුහුණ දීමට හා එම අවදානම් කළමනාකරණය කරගැනීම සඳහා රක්ෂණ සමාගමක් සමග ඇතිකරගන්නා නීතිමය ගිවිසුමකි. ජීවිත රක්ෂණය, රක්ෂණ ව්‍යාපාරය තුළ දීර්ඝකාලීන රක්ෂණය (Long Term Insurance) ගණයට අයත්වේ. වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුව දීර්ඝකාලීන රක්ෂණය පිළිබඳව නිර්වචනය වන්නේ “මරණය හෝ මනුෂ්‍ය ජීවිතයකට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් සිදුවූ විට මුදල් ගෙවීම සහතික කෙරෙන ගිවිසුමක් වේ” යනුවෙනි. රක්ෂණ ඔප්පුහිමියා මියයාම මත හෝ පූර්ණ/අර්ධ ආබාධිත තත්වයට පත්වීම මත හෝ ජීවිත රක්ෂණ ඔප්පුව කල්පිරීම මත හෝ ජීවිත රක්ෂණයේ ප්‍රතිලාභ, ඔප්පුහිමියාට හෝ ඔප්පුහිමියා නම් කරන ලද ප්‍රතිලාභියෙකුට ගෙවීමට රක්ෂණ සමාගම පොරොන්දු වේ.

විවිධ ආකාරයේ ජීවිත රක්ෂණ වර්ග පවතින අතර ඒ සඳහා උදාහරණ පහත දක්වා ඇත.

- ජීවිත රක්ෂණාවරණ
- ආයෝජන සම්බන්ධිත ජීවිත රක්ෂණාවරණ
- වාර්ෂිකයන් (වාර්ෂිකව යම් මුදලක් ගෙවීම)
- අබලතා, හදිසි අනතුරු සහ රෝගාබාධ සඳහා වන රක්ෂණාවරණ
- විශ්‍රාම රක්ෂණ ඔප්පු

2.

# ජීවිත රක්ෂණයක අවශ්‍යතාවය




- ජීවිතයක අවිනිශ්චිතභාවය තේරුම් ගෙන, හදිසි අභාවයකදී ඔහුගේ / ඇයගේ පවුලේ යැපෙන්නන්ගේ මූල්‍යමය අවශ්‍යතා සඳහා මුදල් සපයාගත හැකිවීමත්, ස්වකීය ජීවන මට්ටම පවත්වාගෙන යාමට හැකිවීමත්, අනෙකුත් බැඳියාවන් සපුරාලීමට සහතිකවීමත් වැනි කරුණු ජීවිත රක්ෂණයක් ලබාගැනීම තුළින් අත්විඳිය හැකි ප්‍රතිලාභ වේ.

- පවුලක දූ දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව අඛණ්ඩව කරගෙන යාමට, ඊට සුදුසු රක්ෂණාවරණයක් ලබාගැනීම තුළින් ඉටුකර ගත හැකිය.

- රක්ෂණයක අවශ්‍යතාවය වඩාත්ම දැනෙන්නේ විශ්‍රාම වැටුපක් හෝ වෙනත් අර්ථසාධක අරමුදල් දීමනාවක් නොමැතිව විශ්‍රාම යන පුද්ගලයින්ටය. සුදුසු විශ්‍රාම රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීම තුළින් ඔවුන්ට අදාළ ප්‍රතිලාභ ලබාගත හැකිය.

- බරපතල රෝගාබාධයක් හෝ හදිසි අනතුරක් හේතුවෙන් ඉපැයීම් පහත වැටීමකදී තමන් සතුව අතිරේක ආදායම් මාර්ගයක් තිබෙන බවට වගබලා ගැනීමද ජීවිත රක්ෂණයක් ලබාගැනීම තුළින් ඔබට ලබාගත හැකි තවත් ප්‍රතිලාභයකි.

# 3. තමන්ට සුදුසු ජීවිත රක්ෂණයක් තෝරාගැනීමේ වැදගත්කම



රක්ෂණයක් තෝරා ගැනීමේදී ඔබගේ අවශ්‍යතාවයට සරිලන රක්ෂණාවරණයක් මිලදී ගත යුතුය. කිසිවෙකුගේ බලකිරීම මත රක්ෂණයක් මිලදීගැනීම සිදුනොකළ යුතුය. ඔබගේ අවශ්‍යතාවය මෙන්ම ගෙවිය හැකි වාරික මුදලකට ගැලපෙන රක්ෂණාවරණයක් මිලදී ගැනීම තුළින් ඔබ බලාපොරොත්තු වුනු ප්‍රතිලාභය ලබාගත හැකිය. අනෙක් වැදගත් කරුණ වනුයේ ඔබට දීර්ඝ කාලයක් අඛණ්ඩව ගෙවිය හැකි වාරික මුදලකට රක්ෂණයක් මිලදී ගැනීමයි. ගිවිසුම ප්‍රකාරව වාරික මුදල් ගෙවීමට නොහැකි වුවහොත් රක්ෂණය අක්‍රිය වේ. එසේ වීමෙන් ඔබ බලාපොරොත්තු වූ ප්‍රතිලාභය ලබාගත නොහැකි වේ. එමෙන්ම ඔබගේ වයස, ආර්ථික තත්වය, වියහැකි ආපදාවන් සහ සෞඛ්‍ය තත්වය සලකා බලා සුදුසු රක්ෂණාවරණයක් තෝරාගත යුතුය.

> **“ ඔබගේ අව්‍යතාවයට ගැලපෙන රක්ෂණාවරණයක් ලබාගැනීම තුළින් ඔබ බලාපොරොත්තු වූ ප්‍රතිලාභ ලබාගත හැක. ”**

ඔබ ලබාගන්නා ප්‍රධාන රක්ෂණාවරණයට අමතරව අතිරේක ආවරණද ලබාගත හැකිය. මෙහිදී මූලික වාරික මුදලට අමතරව අතිරේක ආවරණවලට අදාල වන වාරික ඔබ ගෙවිය යුතු වේ.

ඔබට ඒ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍ය වේ නම්, ලියාපදිංචි රක්ෂණ සමාගමක හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගමකින් හෝ එහි සේවයේ නිරත අදාල නිලධාරියෙකු හෝ රක්ෂණ නියෝජිතයෙකු මගින් අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගත හැකිය. එමගින් ඔබගේ අවශ්‍යතාවයන්ට වඩාත් සරිලන රක්ෂණයක් මිලදී ගැනීමට හැකිවේ.

# 4. රක්ෂණ ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි අවබෝධ කරගැනීම



- රක්ෂණ ඔප්පුවක් යනු, රක්ෂණ සමාගම සහ රක්ෂණය ලබාගන්නා රක්ෂණ ඔප්පුහිමියා අතර ඇතිකරගන්නා නෛතික ගිවිසුමකි. රක්ෂණයක් ගැනීමේදී එහි ඇති නියමයන් හා කොන්දේසි පිළිබඳව මනා අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය වේ. රක්ෂණාවරණයට අදාල සියලු නියමයන් හා කොන්දේසි රක්ෂණ ඔප්පුවේ ඇතුලත් කර ඇත. රක්ෂණ හිමිකම් ලැබෙනුයේ මෙම නියමයන් හා කොන්දේසි වලට අනුවය.

- එමනිසා, රක්ෂණ ඔප්පුවේ සඳහන් හිමිකම් නොගෙවන අවස්ථා හිමිකම් ලබා ගැනීම සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග හා ඒ සඳහා ලබා දිය යුතු ලියවිලි පිළිබඳ අවබෝධය තිබීම ඉතා වැදගත් වේ.

> **"රක්ෂණ ඔප්පුවක් යනු, රක්ෂණ සමාගම සහ රක්ෂණය ලබාගන්නා රක්ෂණ ඔප්පුහිමියා අතර ඇතිකරගන්නා නෛතික ගිවිසුමකි."**

- සමහර රක්ෂණ ඔප්පු, මුල් අවුරුදු 03ක කාලය තුළ කිසිදු මුල්‍ය අගයක් අත් කර නොගනී, එවිට එම කාලය තුළ රක්ෂණ ඔප්පුව පවාරණය කළහොත් ඔබට කිසිදු මුදලක් හිමි නොවනු ඇත. එබැවින් ඔබගේ ගෙවීමේ හැකියාව මත රක්ෂණ සැලැස්මේ වාරික මුදල තීරණය කරන්න. කල්පිරීමට පෙර රක්ෂණ ඔප්පුව පවාරණය කළහොත්, එහි උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට ඔබට නොහැකි වේ.

- රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව සෑම රක්ෂණ ඔප්පුවක්ම භාෂා තුනෙන්ම (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) තිබිය යුතු අතර ඔප්පුහිමියාට අවශ්‍ය භාෂාවෙන් ඔප්පුව ලබා දිම අදාළ රක්ෂණ සමාගම සිදුකළ යුතුය. ඒ අනුව රක්ෂණ ඔප්පුහිමියෙකුට තමන් ලබාගත් රක්ෂණාවරණය පිළිබඳව හොඳ අවබෝධයක් ලබාගත හැකිය.

# 5. රක්ෂණයක් ගැනීමේදී සත්‍ය තොරතුරු රක්ෂණ සමාගම වෙත සපයා දී නොමැති විට සිදුවන බලපෑම



ඔබ විසින් යෝජනා පත්‍රයෙහි (Proposal Form) සම්පූර්ණ හා නිවැරදි තොරතුරු සපයා නොමැතිනම් ඔබගේ හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කිරීමට රක්ෂණ සමාගමට හැකියාව ඇත. එබඳු තත්වයක් වලක්වා ගැනීම සඳහා සම්පූර්ණ හා නිවැරදි තොරතුරු රක්ෂණ සමාගම වෙත ලබාදීම සිදුකල යුතුයි. කිසියම් තොරතුරක අදාළත්වය පිළිබඳව යම් සැකයක් ඇත්නම් එම සැකය නිරාකරණය කිරීම හෝ ඒ පිළිබඳව ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් රක්ෂණ සමාගම වෙතින් ඉල්ලා සිටීම හෝ කළ යුතුය. අදාල යෝජනා පත්‍රය, ඔබ සහ රක්ෂණ සමාගම අතර එළඹෙන නෛතික ගිවිසුමෙහි පදනම වනු ඇත. ඔබ විසින්ම එම යෝජනා පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර කිසිම අවස්ථාවක සම්පූර්ණ නොකරන ලද යෝජනා පත්‍රයක් (හිස් යෝජනා පත්‍රයක්) අත්සන් කිරීම සිදුනොකළ යුතුය. කෙසේ වෙතත්, තුන්වන පාර්ශවකරුවෙකු ඔබ වෙනුවෙන් එම යෝජනා පත්‍රය සම්පූර්ණ කරන්නේ නම්, සපයා ඇති පිළිතුරු සම්පූර්ණ, සත්‍ය සහ නිවැරදි බවට තහවුරු කරගෙන අත්සන් කිරීම ඉතා වැදගත් වේ. අදාල ලේඛනයට ඔබේ අත්සන යෙදූ පසු වෙනත් තැනැත්තෙකු එය සම්පූර්ණ කලද, එහි අඩංගු කරුණු වල සම්පූර්ණ වගකීම ඔබ වෙත පැවරේ.

> **"කිසියම් තොරතුරක අදාළත්වය පිළිබඳව යම් සැකයක් ඇත්නම් එම සැකය නිරාකරණය කිරීම හෝ ඒ පිළිබඳව ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් රක්ෂණ සමාගම වෙතින් ඉල්ලා සිටීම හෝ කළ යුතුය."**

ඔබ විසින් රක්ෂණය කරන අවදානමට අදාල සියලුම තොරතුරු යෝජනා පත්‍රයෙහි ස්වේච්ඡාවෙන් ඇතුල් කල යුතුය. විශේෂයෙන්ම රක්ෂණ ගිවිසුම සහමුලින්ම උපරිම විශ්වාසය (Utmost Good Faith) පදනම් කොටගත් ගිවිසුමක් වේ. රක්ෂණයක් ඉල්ලුම්කරන රක්ෂණ යෝජනා පත්‍රයේ සත්‍ය තොරතුරු ඇතුලත් නොකිරීම හෝ වැරදි ආකාරයෙන් තොරතුරු සැපයීම එම රක්ෂණ ඔප්පුව ශූන්‍ය හා අවලංගු බවට පත්කිරීමට හේතු වේ.

# 6.

## රක්ෂණ වාරික මුදල් ගෙවීම අතරමග නවතා දැමීමෙන් ඇතිවන බලපෑම




ජීවිත රක්ෂණ ඔප්පුවක්, ඔප්පුහිමියා අතට පත්වූ දින සිට දින 21 ක කාලපරිච්ඡේදයක් ඇතුළත ඔප්පුහිමියා හට එම රක්ෂණාවරණය සම්බන්ධයෙන් නැවත සලකා බැලීමක් සිදුකළ හැකිය. ඒ අනුව, රක්‍ෂණ ඔප්පුව අඛණ්ඩව පවත්වාගෙන යන්නේද, නැතහොත් අවලංගු කරන්නේද යන්න තීරණය කිරීම සිදුකළ හැකිය. ඔබ යම් හෙයකින් එම කාලපරිච්ඡේදය තුළ රක්ෂණාවරණය අවලංගු කිරීමේ විකල්පය තෝරාගනු ලැබුවහොත් රක්ෂණ සමාගම විසින් දරන ලද වියදම සඳහා ගාස්තුවකට යටත්ව ඔබ ගෙවූ වාරික මුදල් නැවත ඔබ වෙත ගෙවනු ලැබේ.

එමෙන්ම වසර තුනක කාලයක් අඛණ්ඩව වාරික මුදල් ගෙවා ඇති අවස්ථාවක හෝ ගිවිසුමේ පවාරණ අගය ගන්නා කාලසීමාව වසර තුනකට වඩා අඩු කාල පරිච්ඡේදයක් නම්, ඒ සඳහා වාරික මුදල් ගෙවා ඇති අවස්ථාවක ඔබ රක්ෂණ ඔප්පුව අවලංගු කළ යුතු බව තීරණය කලහොත් එය රක්ෂණ සමාගමත් සමග සාකච්ඡා කර තීරණය කළ හැකිය. එහිදී ඔබේ රක්ෂණයට මුදල් අගයක් හෙවත් පවාරණ අගයක් ආරෝපණය වේ. එහි පවාරණ අගය රක්ෂණ සමාගමේ ජීවගණකඥ විසින් නිගමනය කරනු ලැබේ. **එම නිසා රක්ෂණ ඔප්පුවේ පවාරණ අගය හා සම්බන්ධ විධිවිධානද කියවා අවබෝධ කරගැනීම ඉතා වැදගත් වේ**. අදාළ රක්ෂණ ගිවිසුම අත්සන් කිරීමට පෙර මෙම විධිවිධාන පිළිබඳව ඔබේ රක්ෂණ සමාගමෙන්, රක්ෂණ තැරැව්කාර සමාගමෙන් හෝ රක්ෂණ නියෝජිතවරයාගෙන් සියලු කරුණු පිළිබඳ පැහැදිලි කිරීමක් ලබාගත හැකිය.

7.

# නියමිත දිනට රක්ෂණ වාරික ගෙවීමේ වැදගත්කම




රක්ෂණ වාරික මුදල නියමිත දිනයට ගෙවීම ඉතාම වැදගත් වන්නේ එසේ ගෙවීමට අපොහොසත් වීම මත රක්ෂණ හිමිකමක් ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකි වීමයි. එමෙන්ම රක්ෂණ වාරික මුදල් නොගෙවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අවලංගු වීමද සිදුවිය හැක. රක්ෂණ වාරික ගෙවීම සෘජුවම අදාල රක්ෂණ සමාගමට සිදුකළ හැකිය. වර්තමානයේදී රක්ෂණ සමාගම් පාරිභෝගිකයාගේ පහසුව උදෙසා ඩිජිටල් තාක්ෂණය උපයෝගි කරගෙන රක්ෂණ වාරික විවිධ ක්‍රම හරහා ගෙවීමට පහසුකම් සලසා දී තිබේ. රක්ෂණය ලබාගැනීමේදීම වාරික ගෙවිය හැකි ක්‍රම පිළිබඳ අදාළ රක්ෂණ සමාගමෙන්, රක්ෂණ තැරැව්කාර සමාගමෙන් හෝ රක්ෂණ නියෝජිතයාගෙන් දැනුවත් විමට ඔබ වගබලා ගත යුතුය. එමෙන්ම, රක්ෂණ වාරික ගෙවූ බවට තහවුරුවක් ළඟ තබාගැනීම වැදගත් වේ.

**“ රක්ෂණ වාරික මුදල නියමිත දිනයට ගෙවීමට අපොහොසත් වීම මත රක්ෂණ හිමිකමක් ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකි වේ. ”**

# 8. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කරන ආකාරය



**රක්ෂණ හිමිකමක් පිළිබඳව පැමිණිල්ලක් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග**

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා පැමිණිලි විභාග කිරීම සිදු කරන අතර, ඒ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

පළමුව ඔබගේ රක්ෂණ සමාගම වෙත පැමිණිල්ල යොමුකරන්න https://ircsl.gov.lk/insurance-companies/ සමාගම සාධාරණ කාලසීමාවක් ඇතුළත එය නිරාකරණය කර, ඒ සඳහා ඔබට පිළිතුරක් ලබා දිය යුතුය.

ඔබට රක්ෂණ සමාගමෙන් සාධාරණ කාලසීමාවක් තුල පිළිතුරක් නොලැබුනොත් හෝ පැමිණිල්ල නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ඔබ සෑහීමකටපත් නොවන්නේ නම්, ඔබගේ පැමිණිල්ල ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හෝ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කල හැකිය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කර හැකි ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://ircsl.gov.lk/policyholder-complaints/ වෙත පිවිසෙන්න.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවට මාර්ගෝපදේශයක් වශයෙන් ජීවිත රක්ෂණාවරණයක් මිලදී ගැනීමේදී සැලකිය යුතු කරුණු පිළිබඳ මෙම අත්පොත නිකුත් කර ඇති අතර මෙහි ඒ පිළිබඳ සාමාන්‍ය තොරතුරු පමණක් අඩංගු වේ. මෙහි දක්වා ඇති කිසිදු තොරතුරක් රක්ෂණ ඔප්පුවක නියමයන් සහ කොන්දේසි ප්‍රතිස්ථාපනය හෝ ප්‍රතික්ෂේප නොකරයි. රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු සඳහා හෝ වෙනත් අමතර තොරතුරු සඳහා රක්ෂණ සමාගම රක්ෂණ තැරැව්කාර සමාගම හෝ රක්ෂණ නියෝජිතයා අමතා ලබා ගත හැක.

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA


**වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**
**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහළ, නැගෙනහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථනය - 0112 2396184-9 I ෆැක්ස් - 0112 2396190
විද්‍යුත් තැපෑල - mder@ircsl.gov.lk

www.ircsl.gov.lk

https://www.facebook.com/Ircslofficialpage/

https://www.linkedin.com/company/insurance-regulatory-commission-of-sri-lanka/

https://www.youtube.com/channel/UCuM9RLGQTi7B2MM7PL7jfiA



බැඳියාව හා නොපිළිගැනීම
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම අත්පොත මුද්‍රණය කරන ලද අතර කිසිදු නීතී උපදෙස් සැපයීමේ ආදේශකයක් වශයෙන් මෙය උපයෝගී කරගත නොහැක.